මගේ අංකය – RDA/KDY/CE/S/19
ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය
මාර්ග සංවර්ධන අධිකාරිය
මහනුවර.

2024.05.14

...................................................
...................................................

**<u>මහනුවර ප්‍රධාන ඉංජිනේරු කොට්ඨාශයේ කි මී 1500 වැඩ සටහන යටතේ වැඩිදියුණු කටයුතු සිදුකිරීමට යෝජිත මාර්ග වැඩිදියුණු කිරිම කටයුතු සදහා අවශ්‍යවන යන්ත්‍ර කුළී පදනම මත සේවයේ යෙදවීම සදහා මිළ ගණන් කැදවීම.</u>**

මහනුවර ප්‍රධාන ඉංජිනේරු කොට්ඨාශයේ කි මී 1500 වැඩ සටහන යටතේ වැඩිදියුණු කටයුතු සිදුකිරීමට යෝජිත මාර්ග වැඩිදියුණු කිරිම සදහා අවශ්‍ය වන පහත දක්වා ඇති යන්ත්‍ර කුළී පදනම මත සේවයේ යෙදවීම සදහා ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත මිළ ගණන් කැදවනු ලැබේ.

| **අනු අංකය** | **යන්ත්‍රය/වාහනය** | **ආපසු ගෙවන ඇප තැන්පතුව** | **අවශ්‍ය යන්ත්‍ර / වාහන ගණන** |
|---|---|---|---|
| 01 | මාර්ග කම්පන තලන (ටොන් 05) (Vibrating Roller 05 Ton) | රුපියල් 10,000.00 | 04 |
| 02 | මාර්ග කම්පන තලන (ටොන් 10) (Vibrating Roller 10 Ton) | රුපියල් 10,000.00 | 02 |
| 03 | මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය (110-120/140-160 Hp) Motor Grader (10/12 Feet blade) | රුපියල් 10,000.00 | 04 |
| 04 | බැකෝයන්ත්‍ර Backho loder (Extradig /Multibucket) | රුපියල් 10,000.00 | 04 |
| 05 | ටිපර් ටොන් 03 ප්‍රමාණයේ Tipper( 03 Ton ) | රුපියල් 10,000.00 | 10 |
| 06 | ලීටර 4000 වතුර බවුසර (ලොරි රථ) Water bowser | රුපියල් 10,000.00 | 02 |

ඒ සදහා ඔබ කැමැත්තක් දක්වන්නේ නම් මෙහි පහත සදහන් කොන්දේසි වලට අනුකුලව ඉහත යන්ත්‍ර සැපයීම සදහා මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කල හැක.

එක් එක් අයිතමයන් සදහා වෙන වෙනම ටෙන්ඩර් පෝරමයන් ලබා ගැනීම කළයුතු අතර ඒ සදහා සදහා රුපියල් 3025.69 ක මුදලක් (සියලු බදු ඇතුලත්ව) මෙම කාර්යාලය වෙත ගෙවීමෙන් පසු 2024.05.20 දින සිට 2024.06.03 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාර්යාලීය වේලාව තුල ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

සම්පූර්ණ කල ලංසු අයදුම්පත **2024..06.04 දින ප.ව 2.00** පෙර **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,මාර්ග සංවර්ධන අධිකාරිය,අස්ගිරිය,මහනුවර** යන ලිපිනයට තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම කළ යුතුය. මිලගණන් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවර ඔබගේ සැපයුමේ නම සදහන් කරන්න. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. **2024.06.04 දින පෑවඃ 2.30** ට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරුලබා ගැනීමට අවශ්‍ය වේ නම් අංක 081-2234287 දරණ දුරකථනයට ඇමතීමෙන් තොරතුරු ලබා ගතහැකිවේ.

**යන්ත්‍ර සැපයීම** සඳහා තෝරා ගැනීමට අදාල කොන්දේසි -

- ඔබට වැට්බදු (VAT) හිමිකම ඇත්නම් දේශීය ආදායම් බදු දෙපාර්මේන්තුවේ චක්‍රලේඛණයන්ට අනුව කටයුතු කරනු ලැබේ.

- VAT බදු හිමිකම් ඇති සෑම අයදුම්කරුවෙකුගේම වැට් අංකය ටෙන්ඩර්පතෙහි සඳහන් කිරීම අනිවාර්ය වේ.

- යන්ත්‍රයේ හිමිකරු විසින් පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කල යුතු අතර ඉන්ධන ඔබ විසින් සැපයිය යුතු අතරම යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු හා අනිකුත් වියදම් ඔබ විසින් දැරිය යුතුයි. අදාල සියලුම යන්ත්‍ර ක්‍රියාකරු හා සහායකගේ වැටුප් අතිකාල ගමන් වියදම් හා අනිකුත් වියදම් ද ඔබ විසින්ම දැරිය යුතුයි.

- යන්ත්‍ර හා එහි සේවකයින්ගේ ආරක්ෂාව හා රක්ෂණය පිළිබදව පූර්ණ වගකීම සැපයුම්කරු විසින් දැරිය යුතු අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය කිසිදු වගකීමක් දරනු නොලැබේ. නමුත් මාර්ග සංවර්ධන අධිකාරියේ දේපල/ජීවිත වලට යම් හානියක් ඇති වූ අවස්ථාවක සැපයුම්කරු විසින් අලාභය ගෙවීමට කටයුතු කල යුතුයි.

- තවද යන්ත්‍රය සේවයෙහි යෙදීමේදී යම් තෙවන පාර්ශ්වයකට අලාභ හානි සිදු වුවහොත් එහි අලාභයද සැපයුම්කරු විසින් දැරිය යුතුවේ.

- යන්ත්‍ර ක්‍රියාකරු මහතුන් මාර්ග සංවර්ධන අධිකාරියේ මහනුවර දිස්ත්‍රික්කය තුල විධායක ඉංජිනේරු විසින් බලය පවරන ලද නිලධාරියෙකුගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතුයි.

- යන්ත්‍ර සේවයේ යොදවන මීටර් පැය ගණන ගණනය කල හැකි පරිදි එම යන්ත්‍ර වල මීටරය පැහැදිලිව තිබිය යුතු අතර ඒ අනුව අදාල මාසික බිල්පත් ඉදිරිපත් කල යුතුය. මීටර් ක්‍රියා විරහිත යන්ත්‍ර සේවයේ යොදවනු නොලැබේ.

- යන්ත්‍ර සඳහා ඉන්ධන සැපයීම හා අලුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකල යුතු අතර අලුත්වැඩියා කටයුතු සඳහා දිනකට වඩා කාලයක් ගත වේ නම් ඒ සඳහා එම මිලටම ඒ හා සමාන තත්වයේ වෙනත් යන්ත්‍රයක් සැපයීමට සැපයුමකරු බැඳී සිටී.

- එදිනෙදා වැඩ කරන ලද පැය ගණන ඇතුලත් දෛනික සටහන් අදාල විධායක ඉංජිනේරුවරුන් විසින් බලය පවරන ලද අදාල නිලධාරින් ලවා සහතික කරවා ගත යුතුයි.

- වැඩ අවසන් වූ පසු යන්ත්‍ර වැඩ බිමෙන් ඉවත් කර ගැනීම සඳහා ප්‍රවාහන ගාස්තු අධිකාරිය විසින් ගෙවනු නොලැබේ.

- මිළ ගණන් විවෘත කල පසු ඉදිරි දිනකදී යන්ත්‍ර පරීක්ෂාවන් සිදු කරන අතර ඉන් පසුව පමණක් සුදුසු යන්ත්‍ර තෝරා ගනු ලැබේ

- යන්ත්‍ර සඳහා ඉන්ධන සැපයීමේදී මිළ උච්චාවචන සූත්‍රයක් ටෙන්ඩර් පෝරමයේ සඳහන් කර ඇත

එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් රුපියල් 10,000.00 ක් වන ආපසු ගෙවන ඇප තැන්පතුවක් ගෙවිය යුතු අතර මෙම කාර්යාලය එම මුදල ගෙවා ලබා ගන්නා ලදුපතේ පිටපතක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුවේ. එසේ නොමැති ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

..................

ප්‍රධාන ඉංජිනේරු
මාර්ග සංර්ධන අධිකාරිය
මහනුවර